VIDUS 3-4-1

# බුද්ධිගලනය

**එච්. එන්. එස්. කරුණාතිලක**

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති.

අනේකවිධ මුහුණුවරින් යුතු සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණික නිපුනත්වයෙන් යුතු සේවක පිරිස් අත්‍යවශ්‍ය ඇති කලකදී පුහුණු මිනිස් බලය විදෙස් කරා ඇදී යාම නිසා ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය බරපතල ස්වරූපයක් ගෙන ඇත. දෙවන ලෝක සංග්‍රාමයට පෙර බුද්ධිගලනය පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැත. 1890 පමණ සිට වතුවගාවන්හි වැඩ සඳහා නුපුහුණු ඉංදියානු කම්කරුවන් මෙරටට ගෙන්වා ගැනීමට සිදුවිය. එක්දහස් නවසිය පනස් ගනන්වල මැදභාගය පමන වන තෙක් පුහුණු සේවක පිරිස් ශ්‍රී ලංකාවෙන් පිටවී යාම ඉතා සීමාසහිත විය. මීට එක් හේතුවක් වූයේ, සුදුසුකම් ලත් ලාංකිකයන්ගේ සංඛ්‍යාව අදට වඩා ඉතා අඩුවූවාක් මෙන්ම, ඒ වනවිට සංවර්ධනය වන්නාවූ රටවල් බොහොමයක්ම ස්වාධීනත්වය නොලැබ සිටි බැවින් ඒ වනතෙක් සමාජයීය හා ආර්ථික සංවර්ධනාත්මක වැඩසටහන් ආරම්භ කර නොතිබී හෙයිනි. එපමණක්ද නොව, ධනවත් රටවල ද පුහුණු සේවක පිරිස් විශාල සංඛ්‍යාවක් උවමනා නොවිය. දිව යිනේ බර්ගර් ජනතාවෙන් සැලකියයුතු කොටසක් ප්‍රධාන වශයෙන් ඔස්ට්‍රේලියාවේ හා එක්සත් රාජධානියෙහිද පදිංචිවීමට අදහස් කාලෙන්, පනස්ගණන් වල අග කොටසෙහිදී හා හැට ගනන්වලදීද විගමනය අතිවිශාල පරිමානයකින් සිදුවිනා. බර්ගර් ජාතික විගාමිකයන්ගෙන් වැඩි දෙනෙකු උසස් අධ්‍යාපනික හෝ තාක්ෂණික හෝ සුදුසුකම් ලත් අය නොවූ බැවින් මෙයින් බුද්ධිගලනයක් සිදු නොවිය.

### බුද්ධිගලනයට පසුතල වූ ප්‍රධාන සාධක

කලක් මුවල්ලේ, එනම් 1946 හි සිට, නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් වශයෙන් ක්ෂේත්‍ර ගනනාවක සුදුසුකම් ලත් පුද්ගලයන් හා තාක්ෂඥයින් ගනනාවක්ම බිහිවී ඇත. පොදු ජනයාට අධ්‍යාපන පහසුකම් ලබාදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලිවීමේ හා කියවීමේ හැකියාවන් හා තාක්ෂණික ප්‍රවීනතාවන්ද ප්‍රගාමී ලෙස වර්ධනය වීමත් සමගම, සංවර්ධනය වන්නාවූ මෙන්ම සංවර්ධිත රටවලටද අවශ්‍යවී ඇති ප්‍රවීනතාවන් සහිත වූ මහත් සේවක බල ඇණියක් අඛණ්ඩව ශ්‍රී ලංකාව විසින් බිහිකොට ඇත. ශ්‍රී ලංකාවේ පුහුණු වූ හා තාක්ෂණික සුදුසුකම් සහිත පුද්ගලයන්ට එතෙර රැකියා ලබා ගැනීමට ආභාෂය වූ ආර්ථික හා සාමාජික සාධක ගනනාවක්ම ඇත. පුහුණු මිනිස් බල නිපැයුම පහසුවෙන් වර්ධනය කරගැනීමට ශක්‍යතාවයක් ධනවත් රටවලට ඇති වූවද ඔවුහු ඒ සඳහා යථානුගත පියවර නොගත් බැවින්, පසුගිය වසර කිහිපය ඇතුලතදී බුද්ධිගලනය තීව්‍රවී ඇත. එමතුදු නොව, එම රටවල ජනයා, වෛද්‍ය හා ඉංජිනේරු ශිල්ප බඳුවූ සාම්ප්‍රදායික ක්ෂේත්‍ර හා අඩු වැටුප් සහිත වෘත්තීන්ද පිටරටියනට පවරා, සුසංවිහිත වූ හා තාක්ෂණික ප්‍රවීණත්වය අවශ්‍ය වූද වඩා ලාභදායක ලෙස සැලකෙන වෘත්තීන් කරා ඇදී ගොස් ඇත.

පුහුණු මිනිස් බලය අභිමිවී යාම, අධ්‍යාපනික හා පුහුණු වීමේ පහසුකම් බෙහෙවින් දියුණු රටවලට පමණක් සීමා නොවූවකි. අල්පවූ අධ්‍යාපනික හා තාක්ෂණික පුහුණුවීමේ පහසුකම් සැපයීමට වත්පොහොසත් කමක් නැති රටවල පුහුණු මිනිස් බලය ඉවා වඩාත් ධනවත් රටවල් කරා ඇදී ගොස් ඇත. ඉතියෝපියාව බඳු දිළිඳු අප්‍රිකානු රටවල් ගනණාවක්ම මේ ගනයෙහි ලා සැලකිය හැකිය.

ශ්‍රී ලංකාවේ සැහෙන කාලයක් මුලුල්ලේ ක්‍රියාත්මකව පැවතුනාවූ (විශේෂයෙන් පනස් ගණන් වල අග සිටදී) ආර්ථික ප්‍රතිපත්තීන්ද බුද්ධිගලනයට හේතුවී ඇත. විදේශ විනිමය ලබා ගැනීම සීමා කිරීම හා එහි ප්‍රතිපලයක් වශයෙන් එතෙර ගමනාගමනය කෙරෙහි පාලක පැනවීමද නිසා, සුදුසුකම් ලත් බොහෝ අය එතෙර රැකියා ලබා ගැනීමට පෙළඹුණු අතර, සංචාරය රිසිවූවන්ට සිය නඩත්තුව සඳහා පිටරට ජීවනෝපායෙහි යෙදීම හැර කළ හැකි අන් කිසිවක් නොවීය.

1956 සිට 1977 අතර කාලපරිච්ඡේදය තුල වූ සාමාජික හා ආර්ථික ප්‍රතිපත්තීන් කෙරෙහි වූ අතෘප්තිමත් වීම හේතුකොට ගෙනද බොහෝ අය දිවයිනෙන් බැහැරව ගියහ. විගාමිකයන් වැඩි දෙනෙකු ප්‍රසාද ලත් පන්තියේ අය අතර, දේශපාලනමය හෝ සමාජමය වෙනසියාව ඔවුන්ගේ අභිලාෂයන්ට ප්‍රතිවිරුද්ධ වන බව ඔවුනට හැඟින. විශේෂයෙන්ම පනස් ගනනාවල මැද භාගයේ ක්‍රියාත්මක වූ භාෂා ප්‍රතිපත්තිය හේතුකොට ගෙන සිය දරුවන්ගේ අධ්‍යාපනයට බරපතල හානි සිදුවන බව හා ස්වභාෂා මාධ්‍යයෙන් පැවැත්වෙන රැකියා අභිමුඛ පාඨමාලා නිශ්ඵල යයිද ඇතැම් දෙමව්පියවරු කල්පනා කළහ. බර්ගර් ජාතික ඉංග්‍රීසි භාෂාව ව්‍යවහාර කරන අනෙකුත් අයගේ විගමනය සඳහා හේතුවූ එක් වැදගත් සාධකයකි භාෂා ප්‍රශ්නය. බර්ගර් ජාතිකයන් වැඩි දෙනෙකු සිංහල භාෂා ප්‍රවීණත්වය ලබා ගැනීමට වයස ඉක්මවූ අය වූ අතර, ඔවුහු සිය දරුවන් අවාසිදායක තත්වයකට පත් වේනැයි යන මතය දැරූහ. හැට ගනන්වල අගදී හා හැත්තෑ ගනන්වල ද්‍රවිඩ පවුල් ගනනාවක්ම මෙකී හේතුව නිසා රටහැර ගොස් ඇත. ඉංග්‍රීසි භාෂාව වෙනුවට ස්වභාෂාව හඳුන්වා දී, විවිධ සේවා හා කර්මාන්ත ජනසතු කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණ කටයුතු, ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දීම හා වමට බර ආණ්ඩු බලයට පත් වීමද හේතු කොටගෙන තවතවත් වැඩියෙන් ජන කොටස්ගේ විගමනය වීම සිදුවී ඇත.

පාසැල් හා විශ්ව විද්‍යාල අධ්‍යාපන තත්වයන් පිළිබඳව මුළුමනින්ම සෑහීමට පත් නොවූ ජනයාද මෙහි වූහ. හැට ගනන්වල සිට විශ්ව විද්‍යාල පාඨමාලා වැඩි ගනනක්ම ස්වභාෂා මාධ්‍යයෙන් පැවැත්විනි. මූලික වශයෙන් බටහිර පසුබිමක් සහිත වූ අය සිය දරුවන් ස්වභාෂා මාධ්‍යයෙන් ඉගෙනීම ලදහොත් ඔවුන්ගේ ප්‍රාප්තිය කෙරෙහි අහිතකර බලපෑම් ඇති වේයයි බිය වූහ. මෙම කරුණු හැරුනු විට, වෛද්‍ය හා ඉංජිනේරු ශිල්පය බඳු වාසිදායක රැකියා අභිමුඛ පාඨමාලා සඳහා විශ්ව විද්‍යාලවලවූ ඉඩකඩ සීමාසහිත වූ බැවින් හා සියළුම සිසුනට ඇතුලත්වීම සඳහා තීව්‍ර තරඟයක්ද පැවතුනහොත්, තාක්ෂණික සුදුසුකම් හා විශේෂඥ ප්‍රවීනතාවය සහිතවූ දෙමව්පියන් ගනනාවකටම සිය දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ ප්‍රධාන පරමාර්ථය උදෙසා එතෙර රැකියා ලබා ගැනීමට සිදු විය.

සිංහල හා දෙමළ භාෂා අධ්‍යාපන මාධ්‍ය වීම හේතුකොට ගෙන තත්වය පහල වැටීම සිදුවූ අතර, අනිකුත් රටවල් සෑම විටම දේශීය උපාධි පිළිනොගත්හ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්,

ලෝපුරා පිළිගනු ලබන මෙන්ම, විගාමිකයන්ට පහසුවෙන්ම රැකියා ලබා ගැනීමට සලස්වන බ්‍රිතාන්‍ය කැනේඩියානු ඇමෙරිකානු හෝ ඕස්ට්‍රේලියානු සුදුසුකම් සඳහා දැඩි ඉල්ලුමක් පැවතින. එපමණක්ද නොව ශ්‍රී ලංකාවේ විශේෂිත පුහුණුව සඳහා ඇති ඉඩකඩ ඉතා සීමිත වන අතර, මෙරට හා පිටරට රජයේ අනුග්‍රහය සහිතවූ අභ්‍යාස වැඩ සටහන් මගින්, පුහුණුව අපේක්ෂා කරන සියල්ලටම පුහුණු වීමේ පහසුකම් සැලසිය නොහැක. වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය බඳුවූ ඇතැම් වෘත්තීය මණ්ඩල යම් සීමා පනවා ඇති අතර සිසුන් එතෙර ගොස් සුදුසුකම් ලබා ගැනීමට වැඩි මනාපයක් දක්වා ඇත.

මුල් විගමන ප්‍රවාහයේ බලපෑමෙන් එබඳුම්වූ හේතූන් වලින් අභිප්‍රේරණය වූ දෙවන අවධියක් උදා විය. විගමනය කළ පවුලක් තමන්ගේ යහළු මිත්‍රාදීන් හෝ ඥාතීන් හෝ එතෙරට ගෙන්වා ගැනීමට සුහුසුළු වෙති. එබඳු පවුල් වල ඥාතීන්ට යැපීම් මාර්ග තිබීමේ හේතුවෙන් ඔවුහු සිය අධ්‍යාපනය සඳහා ද විදේශයට යාමට පෙළෙඹෙති. මෙයාකාරයෙන් පළමුවෙන් සිදුවූ බුද්ධිගලනයන් ගුණක බලපෑමක් සිදුවෙතැයි පැවසිය හැකි අතර මෙය අද පවා ක්‍රියාත්මකව පවතී. එපමණක්ද නොව බොහෝ අය සිය සහ සේවකයන් හෝ අසල්වාසීන් හෝ අනුකරණය කිරීම උදෙසා විදේශයට යාමට තීරණය කර ඇත. තාක්ෂණික සුදුසුකම් ඇති අයගේ සහ සේවකයන් එතෙර රැකියා නියුක්තියෙහි යෙදී ඇතිනම් විශේෂයෙන්ම එබඳු අයට පිට රට රැකියා ලබා ගැනීම ගුරුත්වයට කරුනකි.

මෙරට රැකියා ලබාගැනීමට ඇති දුෂ්කරත්වය බුද්ධිගලනයට හේතුවක් වශයෙන් බොහෝවිට දක්වා ඇතත්, කැබිනට් උප කමිටු තීරණ වලින් මෙය සනාථ නොවේ. විගාමිකයන් වැඩිදෙනෙකු පිටව යාමට පෙර රැකියාවල යෙදී සිටි අතර, මෙරට රැකියා නොමැති පුද්ගලයන්ට විගාමික වීසා බලපත්‍ර හෝ එතෙර රැකියා හෝ ලබා ගැනීම දුෂ්කර කාර්යයක් වී ඇත. අද මැද පෙරදිග රැකියා සඳහා යන අයට පවා රැකියා තිබී අතර ඔවුන් අතුරෙන් වැඩි දෙනෙකු පුහුණු ශ්‍රමිකයෝ වෙති.

එක්දහස් නවසිය හැට ගනන් වල මුල පමන සිට ක්‍රියාත්මක වූ සීමා හා පාලක, තාක්ෂණික සේවක පිරිස් පිටතට ඇදී යාමට හේතුවූ ප්‍රධාන සාධක වෙති. ගමන් බිමන් සීමා කිරීම හැරුණු විට ආනයනය පිළිබඳ දැඩි පාලන පැනවීම නිසා ඉහල ආදයම් මට්ටමේ පුද්ගලයන්ට අවශ්‍ය විවිධ භාණ්ඩ බොහොමයක්ම මෙහිදී ලබාගත නොහැකි විය. කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ අත්පත් කර ගැනීම වඩා දැන උගත් අභිවර්ධිත ජනසමාජයේ වැදගත් අභිප්‍රායක්ව පැවති බව පෙනී යයි. කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ පිටරට සිට මෙරටට ගෙන ඒමේ භාග්‍ය ලත් අය, එසේ පිට රට යාමට අවස්ථාවක් නොලද අයගේ උපාර්ජන ලැදියාවන් උත්තේජනය කිරීමෙහි ලා සමත් වූහ. මෙබඳු භාණ්ඩ වලින් වඩාත්ම උවමනා වූ දැය මෝටර් රථයකි. අළුත මෝටර් රියක් තරාතිරමේ සංකේතය වුවා පමනක් නොව, හැට ගනන් වල මුල සිට ආනයනය දැඩි ලෙස සීමා කිරීම නිසා වටිනාකම අධික වන වත්කමක්ද ලෙස සලකනු ලැබින. එය වැඩි මිළකට විකුණා ඉන් ලද මුදල, ඉඩමක ගෙයක හෝ වෙනත් ආකාරයකින් හෝ ආයෝජනය කළ හැකි බැවින් වැඩි දෙනෙකු මෝටර් රථයක් ගෙනාහ. තාක්ෂණික සුදුසුකම් ලත් බොහෝ දෙනෙකු, විශේෂයෙන්ම දොස්තරවරු, ඉංජිනේරු වරු හා විශ්ව විද්‍යාල කථිකාචාර්යවරු හුදෙක් මෝටර් රථයක් ගෙනවිටම අදහසින් පමනක් පිටරට රැකියාවක් ලබා ගැනීමේ හෝ ශිෂ්‍යත්වයක් මත පිටරට යාම සිය ජීවිතයේ අභිලාෂය ලෙස සලකනුයේ මන්දැයි වටහා ගැනීම ඇත්තෙන්ම දුශ්කර කාර්යයකි. මෙබඳු සාරධර්මයන් එතෙර රැකියා සෙවීමට තවමත් දඟලන බොහෝ අය අතර අද පවා කැපී පෙනේ.

සංවර්ධිත රටවල් ශ්‍රී ලංකාවට ලබාදී ඇති තාක්ෂණික ආධාර බුද්ධිගලනය ප්‍රවර්ධනයට හේතු වූ තවත් සාධකයකි. දේශීය විශ්ව විද්‍යාල උපාධි හා සුදුසුකම් හැරුණු විට, එතෙර රැකියා සඳහා රටහැර ගිය අයගෙන් වැඩි දෙනෙකු විවිධ තාක්ෂණික ආධාර වැඩි සටහන් යටතේ පිටරට අධ්‍යාපනයක් ලද අය වෙති. මීට ප්‍රධාන වශයෙන් හේතුවන කරුණු දෙකක් ඇත. දේශීය සුදුසුකම් ලත් අයෙකුට වඩා විදේශීය අධ්‍යාපනික සුදුසුකම් සහිත පුද්ගලයෙකුට පිටරට රැකියාවක් ලබා ගැනීම සඳහා වඩා ඉඩකඩ ඇත. මේ හැරුණුවිට මොවුන් පුහුණු වීම හෝ ශිෂ්‍යත්ව කාල පරිච්ඡේදය ඇතුලත ඔවුහු එතෙර ජීවිතයේ වාස්තවික සාරධර්මයන් සමාජයීය ආකර්ෂණ වලට දැඩි ලෙස සංස්ථානය වී ඇත. මෙම හේතූන් නිසා අභ්‍යාස ලාභීහු ආපසු සියරට පෙරලා නොඑති. නැතහොත් පෙරලා පැමිණියාට පසුව යළිදු රටහැර යාමට තීරණය කරති.

විගාමිකයන් එතෙරදී ලැබූ අධ්‍යාපනයෙහි හා සංස්ථාපනයෙහි ප්‍රතිඵලයක් ලෙස මොවුහු ශ්‍රී ලංකාවේ තත්වයන් පහත් කොට සැලකීමට නැඹුරු වෙති. තමන් අයත් රට ඉතාමත් ඌණ සංවර්ධිත වූවක් වන බව හා දිළිඳු රටවලට ඔවුන්ට පිරිනැමීමට පුළුවන් කිසිත් නැතැයි යන හැඟීමක්ද ඔවුන් තුල ඇති බැවින් ඔවුහු තවතවත් දැඩි විවේචනයෙහි යෙදෙති. එතෙර ඔවුන් විසූ රටවල අතිශය අඩුලුහුඩු තම් තිබුනද මේවා නොතකා හරිනු ලබන අතර, ඔවුන් ඉතා දුශ්කර තත්වයන් යටතේ කල්ගත කරන බව නොපවසති. ශ්‍රී ලංකාවේ තමන් ඉපයූ වැටුපින් සෑහීමට පත්ව සිටි බොහෝ අය ඔවුහු එතෙර රැකියාවල නියුතුව සිටි විට විදේශීය මුදලින් ලැබූ වේතන වල රුපියල් අගය අනුව කල්පනා කොට එම වැටුප් අඩු බවට මැසිවිලි නගති.

මෙරටට පෙරලා පැමිණි පසු තමන් නිසිසේ නොසැළකීම පරිපාලකයන් හා නිලබල වාදය අන්සැම අභිබවා සිටීම, පර්යේෂණ සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති කම, සුසංවිහිත උපකරණ හා උපයෝගී සේවා නොමැති කම හා දිළිඳු රටක ලබාගත නොහැකි මෙන්ම එබඳු දෑ සඳහා වත්කමක් නොමැති සියක් කරුණු පිළිබඳව විද්‍යාඥයෝ මැසිවිලි නගති. දිළිඳු රටක තත්වයන් හා අනුකූල වීමට ඔවුන් නොරිසිවීමේ දැඩි බවකුදු ඔවුන් අතර දක්නට ඇත. විද්‍යාඥයන් වැඩි දෙනෙකු එතෙරදී ශුද්ධ හෝ මූලික පර්යේෂණයෙහි යෙදී ඇති අතර, ප්‍රකට හේතූන් නිසා මෙබඳු කාර්යය සඳහා අවශ්‍ය සම්පත් සැම විටම සංවර්ධනය වන්නාවූ රටවලට නැත. එසේත් නැතහොත් එබඳු කාර්ය සඳහා අනුරූපවූ වාතාවරණයක් එබඳු රටවල දක්නට නැත. සංවර්ධනය වන්නාවූ රටවල හදිසි අවශ්‍යතාවයන් ඇත්තේ ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයෙහිය යන්න ඔවුන්ට වටහා දීම දුශ්කර කාර්යයකි.

එතෙර සිට පැමිණි විද්‍යාඥයන් ගෞරවාන්විත සැලකිලි ලැබීම හා මෙරට රැඳී වැඩ කිරීමට වඩා මනාපයක් දැක්වූ අයට ඉහළින්වූ තත්වයක ලා සලකනු ලැබීමටද අපේක්ෂා කරති. මෙය ඉතාමත් අවාසනාවන්ත තත්වයකි. විදේශීය ආයතන හා විශ්වවිද්‍යාලවලට අනුයුක්ත ලාංකික විද්‍යාඥයෝ ප්‍රධාන වශයෙන්ම විදේශ අධ්‍යාපනය ලැබීමේ වරප්‍රසාදය ලත් අය හා වැඩිපුර මුදල්, භෞතික සම්පත් හා වැඩි දියුණු උපකරන ලැබීමේ භාග්‍යයෙන් උසස් වූ අය වෙති. බොහෝ විට මෙම කොටසට අයත් විද්‍යාඥයන්ට වැඩි ප්‍රසිද්ධියක් ලබාදෙන අතර, ඉමහත් පරිත්‍යාගයන් කොට මෙහිම රැඳී කටයුතු කිරීමෙන්, සංවර්ධනය හා සෘජුව බැඳී පවත්නා ප්‍රායෝගික විෂයයන්හි මූලික සේවයක් කළ අයට නිසි සැලකිල්ල නොලැබේ. මෙබඳු සාධක හේතුකොට ගෙන දිවයිනේ තාක්ෂණික හා විද්‍යාත්මක ජනතාව තුල ඉච්ඡාභංගය ඇතිවීමෙන් එමගින් බුද්ධිගලනය ප්‍රවර්ධනය වී ඇත. තාක්ෂණික පුහුණුව ලත් අයට හා විද්‍යාඥයන්ට නිසි සැලකිල්ල ලබා ගැනීමේ අටියෙන් එතෙර සම්භාවනීය ආයතන වල පිහිට පැතීම හැර කළ හැකි අන් කිසිවක් නැත.

මේ පිළිබඳව මෑතකදී හටගත් ප්‍රශ්නයක් මෙහිලා සඳහන් කිරීම වටී. ශ්‍රී ලංකාවට සපැමිණි ලාංකික විද්‍යාඥයෙකු මූලික පර්යේෂණ සඳහා ආයතනයක් මෙහි පිහිට විය යුතුයයි යෝජනා කළේය. මෙම අදහස එකී විද්‍යාඥයා යෝජනා කළ පසු පිළිගනු ලැබීම මවිතයට කරුණකි. ජනමුදූ, 1969 තරම් ඈතදී එවකට කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍ය වරයාව සිටි එම්. ඩී. එච්. ජයවර්ධන මහතා විසින් පත් කරනු ලැබූ මෙරට සම්භාවනීය

විද්‍යාඥයන්ගෙන් හෙබී කමිටුවක්, මූලික පර්යේෂණ පිළිබඳ ආයතනයක් පිහිටුවීම යෝජනා කළ බව අමතක කර ඇත. මූලික පර්යේෂණ සඳහා ආයතනයක් පිහිටුවීම අරබයා කළ පටුපර්යාප්ත යෝජනාවක් වාර්තාවෙහි අන්තර්ගතව ඇති අතර ඊට අමතරව එකතු කළ යුතු කිසිත් නැත. මෙම යෝජනාව පිළිබඳව කලින් රජය විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගනු නොලැබුනු අතර, පිට රටකින් සපැමිණි ලාංකික විද්‍යාඥයෙකු එම අදහස ඉදිරිපත් කළ නිසා එය දැන් සැලකිල්ලට ලක්ව ඇත.

බුද්ධිගලනයට හේතු සාධකවූ හුදු ආර්ථික සාධක ගනනාවක්ම ඇතත්, මේවා දේශීය ආර්ථික ප්‍රතිපත්තීන් නිසා පමණක් නොව, රටවල තුලනාත්මක ජීවන තත්වයන් හා රුපියලේ ක්‍රය ශක්තිය (විශේෂයෙන් පිටරට නිෂ්පාදිත බඩු මිළට ගැනීම සම්බන්ධයෙන්) ඇසුරුකොට උද්ගතවූ ඒවා වෙති. රුපියලෙහි ප්‍රගාමී අවමූල්‍යනයද බුද්ධිගලනය තවත් තීව්‍ර වීමට හේතුවූ කරුණකි. 1949 හිදී රුපියල අවමූල්‍යනය කරනු ලැබූ තැන් පටන් රුපියලේ විනිමය අනුපාතය මෙරට වාසීන්ට අහිතකරවී ඇත. එවකට ඩොලර් එකක වටිනාකම රු. 4.80 ක් පමණක් වූ අතර, රුපියල අවමූල්‍යනය කිරීමෙන් පසුව එහි අගය සියයට තුන් සියයකින් වැඩිවී ඇත. විදේශ මුදල්වල ක්‍රය ශක්තිය සමග රුපියල සමාන කර බැලීමේදී ඒවා අතිශයින් ඉහල නැග ඇති අතර එයින් තදබල බලපෑම් සිදුවී ඇති බව පෙනේ.

මේ නිසා එතෙර රැකියාවල නියුතු තාක්ෂණික සුදුසුකම් සහිත අයගේ වැටුප් වල රුපියල් අගය කිහිපවාරයක්ම ගුණිත වී ඇත. අද තුලනාත්මකව. සරල රැකියාවල නියුතුවූවන් මසකට රු. 15,000/- ක වැටුපක් උපයන බව අසන්නට ලැබේ. මීට හේතුවී ඇත්තේ වර්තමාන විනිමය අනුපාතය අනුව ඩොලරයක් රු. 15/- කුත් බ්‍රිතාන්‍ය පවුමක් රු. 30/- කුත් වටිනා හෙයිනි. විශේෂයෙන්ම 1968 සිට විනිමය අනුපාතය සීඝ්‍රයෙන් අවමූල්‍යනය වී ඇත. මෙම කරුණ හේතුකොටගෙන ලාංකිකයන් ඔවුන්ගේ දේශීය වැටුප් බොහෝ සේ ප්‍රමාණවත් නොවන බවට මෙරටදී මෙන්ම එතෙරදීද හිමිකම් පෑම කෙරෙහි තවත් රුකුල් ලැබී ඇත. දේශීය වැටුප් ප්‍රමාණවත් නොවන බව නොව ප්‍රධාන හේතුව වී ඇත්තේ, රුපියලේ විදේශ අගය සැලකෙන පමන පහත වැටී තිබීමය. 1977 හිදී විදේශ විනිමය අනුපාතය ඒකාබද්ධ කිරීමෙන් පසු හා අනතුරුව සියයට 85 කින් පමණ රුපියල අවමූල්‍යනය කිරීමට පසුව මෙය වඩාත් තීව්‍ර වී ඇත.

මෙම තත්වය කෙතරම් හාස්‍යජනක එකක්ද කිවහොත්, පිටරටවල ගෙවනු ලබන වැටුප් රුපියල් වලට පරිවර්තනය කළ හොත්, යුරෝපයේ රටවල රැකියා රහිත අය හෝ විරක්ෂිත දීමනා ලබන අය පවා මෙරට ඉහලම වැටුපක් ලබන අයට වැඩි මුදලක් උපයති. උදාහරණයක් වශයෙන් ගතහොත්, නෙදර්ලන්තයේ ෆ්‍රෑන්ක් 1400 ක විරක්ෂිත දීමනාවක් ගෙවනු ලැබේ. ශ්‍රී ලංකා මුදලින් මෙය රු: 10,500 ක් පමණ වේ. මෙරට එබඳු වැටුපක් ලබන්නේ ඉතාමත් අල්ප සංඛ්‍යාවක් වුවද මෙම මුදල ගුණිත වී ඇත්තේ, ප්‍රවර්තන විනිමය අනුපාතය අනුව හා රුපියලේ අගයද පහත වැටී ඇති බැවිනි. මිනිස් බලය හා තාක්ෂණික පුහුණුව ලත් සේවක පිරිස් එතෙරට ඇදී යාම වැඩිවීමට තුඩු දුන් ප්‍රධාන හේතුව ආර්ථික හා දේශපාලනමය තත්වයන් කෙරෙහි වූ අතෘප්තිමත් භාවය වුවද, 1977 ට පෙර වැනි වශයෙන්ම විනිමය අනුපාතය පහතවැටීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් උද්ගතවූ ගුණිතය බලපෑම ඊට හේතුවක් වූ බව පෙනේ.

නුපුහුණු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම මැද පෙරදිග ලාභදායක රැකියා නියුක්තිය සඳහා ඉඩ සැලසී ඇත්තේද මෙම හේතුව කාරණ කොට ගෙන වුවද, මැදපෙරදිග වැටුප් ව්‍යුහය අනුව බැලීමේදී මොවුන්ට ගෙවනු ලබන්නේ ඉතාමත් සුළු වැටුපකි. මෑතකදී පළවූ වාර්තාවක් අනුව, ලාංකිකයන්ට අඩුම වැටුප් ගෙවනු ලබන වුවද පකිස්ථාන්, ඉන්දියානු හා අරාබි ජාතිකයන්ට ඊට වඩා වැඩි වැටුපක් ලැබුනද ඇමරිකානු හා යුරෝපා ජාතිකයන්ට ඉහලම වැටුප් ගෙවනු ලබන බව එළිදරව් වී ඇත. මැදපෙරදිගට යන නුපුහුණු සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් විදේශ විනිමයෙන් තමන් ලබන වැටුප් ඉතාමත් අල්ප බව දන්නා නමුදු විනිමය අනුපාතය අනුව ඔවුන්ට දේශීය මුදලට පරිවර්තනය කළ පසු සැහෙන ධනයක් රැස් කර ගත හැක. හැකි තරම් කෙටි කාලයක් ඇතුළතදී හැකි තරම් ධනය උපයා ගැනීම හා පෙරළා සියරට පැමිණි පසු දිගු කාලයක් මූලධනය වැය කිරීමෙන් ජීවිකාව කළ හැකිවන අන්දමට සිය ඉතිරිකිරීම් මෙරටට එවීම යන මූලික කරුණු මුල් කරගෙන මෙම විගාමිකයෝ කටයුතු කරති.

එබැවින් මොවුන් පෙරලා සිය රටට ගෙන්වා ගැනීමට නම්, රුපියලේ අගය වැඩිකල යුතු ලෙස පෙනුනද, මන්දගාමී හා දීර්ඝ කාලීන කාර්යාවලියක් වනු ඇත.

පාලක ඉවත් කිරීමේ හා නිදහස් කිරීමේ වර්තමාන ප්‍රතිපත්තීන්ගෙන්ද බුද්ධිගලනය අඩුවූවක් නොපෙනේ. ඇත්තවශයෙන්, ඕනෑම වේලාවක රටින් පිටව යාමට හා විදේශ විනිමය ස්වල්පයක් රැගෙන යාමටද නිදහස ඇති බැවින් මෙය තවත් වැඩිවී ඇත. කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ දැන් මෙහි සුලභ වන බැවින් එබඳු දෑ මිළදී ගැනීමට වූ අභිප්‍රාය දැන් අඩුවී ඇත. පිටරට නොගිය ලාංකිකයන්ට පවා තෑගි ක්‍රමය යටතේ මෝටර් රථයක් ලබාගත හැකි බැවින් විනිමය උපයා නොගත්තද මෝටර් රථයක් හිමිකර ගැනීමට දැන් අවස්ථාව සැලැසී ඇත.

## බුද්ධිගලනයෙන් ඇතිවන වාසි හා පාඩු

පුහුණු සේවක පිරිස් විගමනය කිරීම විගාමිකයා පදිංචි රටට වාසිදායක යයි ඇතැම් අය තර්ක කරති. මෙසේ කරනුයේ විගාමිකයා එතෙර රැකියාවෙහි නියුතුවන අතරම සිය රටට ප්‍රයෝජනවත් විය හැකි ප්‍රවීණතාවයන් ප්‍රවර්ධනය කරගැනීම හා ඔහු පෙරළා සිය රටට පැමිණීමද සිදුවේය යන අභ්‍යුපගමනය මතය. එහෙත් පිටරට අධ්‍යාපනය ලැබූ ලාංකිකයන් වැඩි දෙනෙකු සම්බන්ධයෙන් මෙය සිදු නොවී ඇති බව පෙනේ. එම රටෙහි සංස්කෘතිය හා කෙමෙන් සංකලනය වීම හා ඊට අනුරූපවූ පවුල් ජීවිතයක් හා සමාජයීය චාරිත්‍ර වාරිත්‍ර වර්ධනය වීමත් සමගම ඔහු සිය මව් රටින් මෑත්වීමට වඩා නැඹුරුවන අතර ඔහුට සිය මව් රටෙහි සේවය සඳහා මුළුමනින්ම යෝග්‍ය ලෙස සංස්ථාපනය නොවූවකුද බවට පත්වී ඇත.

කිට්ටු නෑදෑයන් හෝ යැපෙන්නන් හෝ ඇති විටදී විගාමිකයෝ ඇතැම් විට සියරට වලට මුදල් හදල් එවීම කරති. විගමනයෙන් මුදල්මය වාසි ඇති වනුයේ විගමනය තාවකාලික වන්නේ නම් පමණි. විගමනය ස්ථිර වූයේ නම් එසේ සිය රටට මුදල් හදල් එවීම ඇනහිටිනු ඇත. විගාමිකයා එතෙරදී ලැබ ගන්නා පුහුණුව හා තාක්ෂණය සංවර්ධනය වන්නාවූ රටවල්වලට උචිත නොවීමේ බියද පවතී. සංවර්ධිත ලොව බිහිවී ඇති තාක්ෂණයෙන් සියයට 95 කට වැඩි ප්‍රමාණයක් සංවර්ධනය වන්නාවූ රටවල අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සංස්ථාපනය නොවන බවට තක්සේරු කර ඇත. දිළිඳු රටවල තුලනාත්මකව දුර්වල ආර්ථික තත්වයන් හා සම්පත් හේතුකොට ගෙන මෙම තාක්ෂණයෙහි උපයෝගීතාවය සීමිත වේ.

ප්‍රවීණත්වයන් වඩාත්ම අවශ්‍ය රටවල් කරා ප්‍රවීණතාවයන් ඇදී යාම, ජාත්‍යන්තර වෙළඳ පොල පිළිබඳ යන්ත්‍රණයෙන් තහවුරු වීමේ න්‍යායධර්මය වර්තමානයෙහි අදාළ බවක් නොපෙනේ. තාක්ෂණික පුහුණුව ලත් සේවක පිරිස් පිළිබඳ අවශ්‍යතාවය පිරිපුන් රටවල් කරා තවතවත් පුහුණු සේවක පිරිස් ආගමනය වීම සිදුවී ඇත. ධනවත් රටවල රැකියා පිණිස යන දොස්තරවරුන් හා අනිකුත් විද්‍යාඥයන් වැඩි දෙනෙකු අඩු සංවර්ධිත ප්‍රදේශවලින් පැමිණි අය වෙති. අප්‍රිකාවේ නොදියුණු රටවල් ගනනාවක්ම තාක්ෂණයන් හා විද්‍යාඥයන් ලොව ධනවත් රටවල් කරා ඇදී ගොස් ඇත. එකී න්‍යාය ධර්මය සත්‍ය නම්, පුහුණු සේවක පිරිස් ආගමනය කළයුත්තේ, වෛද්‍යවරු හා ඉංජිනේරුවන් හිඟයක් පවත්නාවූද, වඩාත් මූලික හා අත්‍යවශ්‍ය සංවර්ධන ගැටළු විසඳීම උදෙසා විද්‍යාඥයන් අවශ්‍යව ඇත්තේ වඩාත් අඩු සංවර්ධිත ප්‍රදේශ වලටය.

එපමණක්ද නොව. දුප්පත් රටවල මෙබඳු පුහුණු සේවක පිරිස් බිහිකිරීමෙහි ලා ඉමහත් සම්පත් ප්‍රමාණයක් උපයෝජනය කොට

අත. ආසියාවේ අනෙකුත් රටවල හා අප්‍රිකාවේද නිදහස් තාක්ෂණික අධ්‍යාපනයක් නොමැති අතර ශ්‍රී ලංකාව මේ සඳහා ඉතා විශාල මුදලක් වැය කරයි. ශ්‍රී ලංකාවේ සියළුම උපාධිධාරීන් හා විද්‍යාඥයන් විශ්වවිද්‍යාලවල හෝ රජයේ ආයතනවල හෝ නොමිලේ අධ්‍යාපනය ලබා ඇති බැවින් සියයට සියයක සහනාධාරයක් ලබාදී ඇති බවක් අදහස් කෙරේ. සංවර්ධනය වන්නාවූ රටවල දුලබ මුල්‍ය හා තථ්‍ය සම්පත්, බ්‍රිතානය, ඕස්ට්‍රේලියාව හා එක්සත් ජනපදය බඳු රටවල අධික මිළක් ගෙවා ලබාගතයුතු සේවාවන් සැළසීම සඳහා සහනාධාර වශයෙන් වැය කරනු ලැබේ. කිසිදු මිළමුදලක් නොගෙවා අධ්‍යාපනයක් ලද ශ්‍රී ලාංකික දොස්තරවරු හා වෙනත් සුදුසුකම්ලත් සේවක පිරිස්, අඩු වැටුපක් සඳහා පිටරටවල රැකියාවෙහි යෙදීමෙන්, තාත්වික වැටුප් ගෙවීමට තරම් වත්පොහොසත් කමක් ඇති ධනවත් ජන කොට්ඨාශයකට සහනාධාරයක් සලයති.

ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය හේතුකොට ඇතිවූ සමාජයීය ප්‍රතිඵල බොහෝය. විශේෂඥ ප්‍රවීණතාවයන් අවශ්‍ය ඉංජිනේරු, තාක්ෂණික, වෛද්‍ය හා අනෙකුත් සේවා අභිවර්ධනය කිරීමෙන් ආර්ථික සංවර්ධනයට පිහිටක් ලබාදේය යන විශ්වාසය ඇතිව ශ්‍රී ලාංකික ආදයම් බදු ගෙවන්නෝ රටේ විද්‍යාඥයන්ගේ හා තාක්ෂණික සේවක පිරිස් වල අධ්‍යාපනය උදෙසා මුදල් යෙදවූහ. එක් අතෙකින්, මෙහි නොමිලේ සපයනු ලබන පහසුකම් වලින් ප්‍රයෝජන ගෙන, එහි ආයෝජන වලින් උපරිම ඵල නෙලාගනු වස් රටහැර ගොස්, එකී ප්‍රතිලාභ හිමිවිය යුතු සිය රටියනට ඒ අහිමිකොට පරදේශීන්ට ඒ පිරිනැමීම අකටයුත්තකි. විශේෂයෙන්ම සහනාධාර වලින් බරවූ අධ්‍යාපනයක් ඇති රටවල අධ්‍යාපන ලාභීහු පළමුව සැහෙන දීර්ඝකාලයක් එම රටවලට සේවය කිරීම සඳහා සදාචාරාත්මකව බැඳී පවතී. විද්‍යාඥයන්, වෛද්‍යවරුන් හා ඉංජිනේරුවන්ට එය ප්‍රවීණතාවයන් තවත් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය රසායනාගාර හා වෙනත් පුහුණු කිරීමේ පහසුකම් ශ්‍රී ලංකාව වැනි දිළිඳු රටවල නැතිබව සුලභ තර්කයකි.

බුද්ධිගලනය සිදුවීමෙන්ම, මෙරට පර්යේෂණ හා උසස් තාක්ෂණික අභ්‍යාස ආයතන සංවර්ධනය කිරීමට ඇති සෑම අවස්ථාවක්ම නොලැබී යනු ඇත. උසස් තාක්ෂණික පුහුණුව ලත් සේවක පිරිස් මෙරට රැඳුනිනම් ඔවුන්ට මෙරට පර්යේෂණ හා තාක්ෂණික අභ්‍යාස ආයතන පිහිටුවීම හෝ ප්‍රවර්ධනය කිරීමට පුළුවන් කමක් තිබුනි. රටේ විද්‍යාත්මක හා තාක්ෂණික මිනිස් බලයෙහි කේවලත්වය ඒ මත රඳා පවතිනු ඇත. එබැවින් පුහුණු සේවක පිරිස්, අහිමිවියාම සිදුවන රට කෙරෙහි බුද්ධිගලනයෙන් සිදුවන ආදීනව නිෂේධාත්මක ගුණිත බලපෑමක් ඇති විෂම චක්‍රයක ස්වරූපය ගෙන ඇත.

**මිනිස් බලය අහිමිවීම පිළිබඳ නියම තත්වය :**

1970 මැයි සිට 1976 දෙසැම්බර් මාසය දක්වා අතර කාලය තුල වෛද්‍යවරුන් 1254, ඉංජිනේරුවන් 1074, ගණකාධිකාරීන් 499, විශ්වවිද්‍යාල ගුරුවරුන් 144, හා වෙනත් පුහුණු සේවක පිරිස් 1325 ක් එතෙර රැකියා සඳහා රටහැර ගොස් ඇත. ඉතාමත් දළ පදනමක් මත, මොවුහු එවකට මෙරට වෘත්තීය හා තාක්ෂණික සේවක පිරිසේ මුළු සංඛ්‍යාවෙන් සියයට 15 ක් පමන වේ. වෛද්‍යවරු හා ගණකාධිකාරී සම්බන්ධයෙන් විශේෂයෙන්ම වෛද්‍යවරු සම්බන්ධයෙන් අනුපාතය ඉතාමත් අධිකවූ අතර, නවක වෛද්‍යවරයෙකු රටින් පිටවී යාමට අඩු වශයෙන් අවුරුදු පහක්වත් සේවයෙහි යෙදී සිටිය යුතුයයි නිගමනයක් පැවතුනද අවුරුදු පතා රටහැර යන අයගේ සංඛ්‍යාව වැඩිවී ඇත.

ප්‍රවීණතාවයන් පිළිබඳ දැඩි හිඟයක් පවතින්නාවූ ක්ෂේත්‍රවල තාක්ෂණ පුහුණුව ලත් පුද්ගලයන් මෙරටට අහිමිව යාමේ අභාග්‍ය සම්පන්න තත්වයකට ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදුව ඇත. තත් රටවල අවශ්‍යතාවයන් හා අනුකූලවූ සේවාපිරිස් ඇත්තාවූද මෙබඳු විශේෂිත ක්ෂේත්‍රවලට බඳවාගනු ලබන අභ්‍යාසලාභී, සංඛ්‍යාව දෙගුන කිරීමට වුවද වත්පොහොසත් කමක් ඇත්තාවූද, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, නවසීලන්තය බඳු රටවල් කරා විගමනය සිදුවීම වඩාත් කණස්සල්ලට හේතු වේ.

මේ වනතෙක් ශ්‍රී ලංකාවට අහිමිවූ පුහුණු සේවා පිරිස් සංඛ්‍යාව මේ දක්වා පළකරන ලද සංඛ්‍යා වලින් ප්‍රමාණවත් ලෙස නිරූපණය නොවේ. එතෙර සිය අධ්‍යාපනය හා පුහුණුව ලැබීමෙන් පසුව පර්යේෂණ ආයතනවල නියුතුව සිටින හා ස්ථිරව පිටරට රැඳී සිටින සිය ගනන් ලාංකිකයන් මෙම දත්තයන්හි ඇතුලත්වී නැත. මෙම ගනයට වැටෙන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවන බව පෙනේ. සිය දරුවන්ට එතෙර අධ්‍යාපනයක් ලබාදෙන දෙමව්පියන්ට ඔවුන්ට අධ්‍යාපනය ලද පසු එතෙරදීම රැකියා ලබාගැනීම උවමනාවී ඇත. මීට හේතුව වී ඇත්තේ ඔවුන්ට පෙරලා මෙරටට පැමිණීමට නම් ශ්‍රී ලංකාවේ ආයතන මගින් ඔවුන්ට ගරුත්වය හා ජ්‍යෙෂ්ඨත්වය සහිත තනතුරු පිරිනමනු ලැබීම මෙම දෙමව්පියන් බලාපොරොත්තු වීමය.

ඔපෙක් සංවිධානයේ රටවල් 1973 හිදී ඉන්ධන මිළ ඉහළ නැංවීමට තීරණය කළාට පසුව, පුහුණු සේවක පිරිස් මැද පෙරදිග හා බටහිර ආසියාතික රටවල් කරා ඇදී යාම සිදුවිය. මෙබඳු රටවල රැකියා පිනිස යන අය, ධනවත් රටවල හෝ එතරම් සංවර්ධිත නොවූ නුපුහුණු සහ අර්ධ පුහුණු සේවකයන්ට රැකියා ලබාගත නොහැකි රටවලට ගිය අයට වඩා වෙනස්ය. බටහිර ආසියාතු රටවල් පුහුණු හා අර්ධ පුහුණු සේවකයන් විශාල සංඛ්‍යාවක් රැකියා සඳහා ගෙන්වාගෙන ඇත. අරාබි රටවල රැකියා පිණිස ගිය නුපුහුණු ශ්‍රමිකයන් ප්‍රධාන වශයෙන් ගෘහ දාසීන් හෝ මෙමහකරුවන් ලෙස සේවය කරති.

බටහිර ආසියාතික රටවල් මධ්‍යම හා පහළ ආදයම් මට්ටමේ විගාමික පවුල් සඳහා නව දෘෂ්ටිපථයක් එළිකොට ඇත. අධ්‍යාපනයක් නොලැබ තිබීම, භාෂා ප්‍රශ්න, හා වෙනත් සමාජයීය බාධක හේතුකොටගෙන මෙම කොටසට අයත් අයට වූ අවස්ථා සීමාසහිත විය. බටහිර ආසියාතික රටවල් කරා විගමනය වීමෙන් සමස්තයක් ලෙස ගත්කළ එය රට කෙරෙහි වඩාත් පුළුල් බලපෑමක් ඇතිවී ඇත. බටහිර ආසියාවට විගමනයෙන් ඇතිවූ ආදයම් ප්‍රතිව්‍යාප්තිය පුහුණු සේවක පිරිස් වඩාත් ධනවත් රටවලට හෝ ඌණ සංවර්ධිත රටවල් කරා ඇදී යාමෙන් ඇතිවූ ප්‍රතිඵලවලට වඩා වැඩි වැදගත් කමකින් යුතුය. එමගින් අඩු ආදයම් හා විරැක්ෂිත භාවය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් යම් සමනක බුරුලක් ලැබීමට අනියම් වශයෙන් හේතුවී ඇත්තේ, මොවුනතුරෙන් වැඩි දෙනෙකු රැකියා විරහිත වූවන් හෝ අර්ධකාලීන රැකියාවල හෝ යෙදී සිටි අයවූ බැවිනි. වඩාත් වැදගත් වනුයේ බටහිර ආසියාවට ශ්‍රමිකයන් ගලා යාමත් සමගම මෙරටට ප්‍රේෂණය කරනු ලබන විදේශ විනිමය වැඩිවී ඇති අතර, මෙය දැන් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලැබෙන්නාවූ ප්‍රධාන මූලාශ්‍රයක් බවට පත්ව ඇත.

මූලික ඇස්තමේන්තු අනුව 1976 ජනවාරි සිට 1978 ජූනි දක්වා කාලය තුල ආසියාවට විගමනයවී ඇති මොවුන් අතර, තාක්ෂණ ශිල්පීන් (පිරිමි) 720, මේසන්වරුන් 2840, වඩු කාර්මිකයන් 2665, යාන්ත්‍රික ශිල්පීන් 2171, හා නුපුහුණු කම්කරුවන් 5452 කු වෙති. නියම සංඛ්‍යාවන් මීටත් වඩා වැඩිවන බැවින් මෙම ඇස්තමේන්තු වල පවා නියම සංඛ්‍යා ඇතුලත්වී නැත. මැදපෙරදිග රැකියා වෙළඳපොල හේතුකොට ගෙන අනිකුත් ලාංකිකයන්ට රැකියා නියුක්තිය සඳහා ඉඩකඩ ඇත. රැකියා ඒජන්සි ගනනාවක්ම බිහිවී ඇති අතර, නිතිපතා පුවත්පත් වල පලවන දැන්වීම් අනුසාරයෙන් බලන කළ ඔවුන් බෙහෙවින් වාසිදයක ව්‍යාපාරයක යෙදී ඇති බව පෙනී යයි.

අභ්‍යාස හා පර්යේෂණය සඳහා එක්සත් ජාතීන්ගේ ආයතනය වෙනුවෙන් කොළොම්බියා විශ්වවිද්‍යාලයේ විළියම් ග්ලේසර් පැවැත්වූ අධ්‍යාපනයක් අනුව, සංවර්ධනය වන්නාවූ රටවල සිසුන් හා කර්මාන්ත අතින් දියුණු රටවල වෘත්තිකයන්ගෙන් ලැබී ඇති ප්‍රශ්නෝත්තර 6500 කින් සියරට හැරයන උගතුන් ඇත්තවශයෙන් කවුරුන්දැයි යන්න පිළිබඳ වැරදි සංකල්ප බිඳ වැටේ.

මොවුන් රටහැර යාමට පොළඹවන නියම හේතුන් මුදල් නොවේ. ප්‍රංශයේ හා බ්‍රිතාන්‍යයෙහිද විදේශිකයන්ට අඩු වැටුප් ගෙවනු ලබන අතර, ඉරානය හා බ්‍රසීලය සංවර්ධිත රටවල් බොහොමයකට වඩා වැඩි වැටුප් ගෙවයි.

වැඩි පහසුකම්, පර්යේෂණය සඳහා කාලය, හා වෘත්තීය ක්ෂේත්‍රවල නව සංවර්ධන පහසුවෙන් සම්ප්‍රාප්තවීමට හැකියාව යනාදී වරප්‍රසාද සංවර්ධන රටවලින් පිරිනමනු ලබන බැවින් මොවුහු එබඳු දූයින් නමන්ට වඩාත් ඵල නෙලා ගත හැකි යයි විශ්වාස කරති.

සංවර්ධිත රටවල ප්‍රමාණවත් ආදායම් හා ජීවන තත්වයන් මගින් මුදල් වලට වඩා මෙම විගාමිකයන් පොළඹවනු ලැබේ.'' යයි ග්ලේසර් මහතා පවසා ඇත.

සංවර්ධනය වන රටවල්, එනර සිටින මොවුන්ගේ සිසුන් සමග සම්බන්ධතා පවත්වාගෙන යාම හා උචිත රැකියා අවස්ථා ඇතිවූ විට ආපසු කැඳවිය හැකි ප්‍රවීණ පුද්ගලයන්ගේ නාම ලේඛන විසුරුවා හැරීමද කළ යුතුය.

ඉන්දියාවේ මෙය ක්‍රියාත්මක කරවන ලදී. ස්වාධීනත්වය ලැබීමෙන් පසු 1955 හිදී ඉන්දියාවෙන් පිටව ගිය විද්‍යාඥයන්ගේ ලැයිස්තුවක් පිළියෙල කරන ලද අතර 1978 වන විට එහි විද්‍යාඥයන් හා ඉංජිනේරුවන් 20,000 ක් ඇතුලත් විය. එය ඉන්දියාවෙන් බැහැර සිටින සංඛ්‍යාවෙන් අඩක් පමණි.

1978 මුල් භාගයේදී රටහැර ගිය 11,000 දෙනෙකුට පමණ දෑ අවුරුදු කොන්ත්‍රාත් පදනමක් මත රැකියා පිරිනමන ලදී. රැකියා බාරගත් 7000 ගෙන් 6000 දෙනෙකුම ස්ථිරවම සියරට පදිංචි වීමට තීරණය කළහ.

1975 හිදී ඉන්දියාව විසින්, විද්‍යාඥයන්ට සති දෙකක පමණ කාලයක් පර්යේෂණ රසායනාගාර වලට යාමට අවස්ථාව සලසමින් බාහිර මහාචාර්ය වරුන්ගේ සැලැස්ම පැවල කර ඇත.

ශෙනස්ටර් යර්වන්ටේ

'ඩෙජත්තිච්ස් ස්පෙෂල්'